සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ශ්‍රී ලංකා ඉතිහාසය - I

**13 ශ්‍රේණිය** | **කාලය පැය 01 යි.**

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියලුම ප්‍රශ්න වලට මෙම ප්‍රශ්නපත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහ බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එකක් පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති තිත් ඉර මත ලකුණු කරන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු එම කොටස II කොටසේ පිළිතුරු පත්‍ර සමඟ අමුණා භාර දෙන්න.

---

- අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැලපේ. එම නොගැලපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය තිත් ඉර මත ලියන්න.

(01) (1) මාගම (2) මාපුටු (3) මහවොට්
(4) මාන්තෝට්ටම් (5) මාන්තායි (......)

(02) (1) දීපවංශය (2) සමන්තපාසාදිකා (3) මහාවංශය
(4) වංසත්ථප්පකාසිනිය (5) පැරකුම්බා සිරිත (......)

(03) (1) ලොපෙස් ද සූසා (2) ජෙරනිමෝ ද අසවේදු (3) කොන්ස්තන්තිනු ද සා
(4) විලෙම් ජේ. කොස්ටර් (5) දියෝගු ද මේලෝ (......)

(04) (1) ථූපාරාමය (2) ලංකාරාමය (3) මැදිරිගිරිය
(4) අම්බස්තලය දාගැබ (5) රුවන්වැලි සෑය (......)

(05) (1) මුල්ලේරියාව (2) වෙල්ලස්ස (3) ගන්නෝරුව
(4) රන්දෙනිවෙල (5) දන්තුරේ (......)

(06) (1) සේනාසම්මත වික්‍රමබාහු (2) ජයවීර බණ්ඩාර (3) කරලියැද්දේ බණ්ඩාර
(4) රයිගම් බණ්ඩාර (5) කොනප්පු බණ්ඩාර (......)

(07) (1) ලංකා ලෝකය (2) ඥානාර්ථ ප්‍රදීපය
(3) ගම්පෙරළිය (4) හින්දු ඕගන් (The Hindu Organ)
(5) ලක්රිවි කිරණ (......)

(08) (1) ආනන්ද විද්‍යාලය (2) රාජකීය විද්‍යාලය (3) හින්දු විද්‍යාලය
(4) සහිරා විද්‍යාලය (5) ධර්මරාජ විද්‍යාලය (......)

(09) (1) 1840 ඉඩම් අත්පත් කර ගැනීමේ පනත
(2) 1865 මහ නගර සභා පනත
(3) 1897 මුඩු බිම් පනත
(4) 1931 බෞද්ධ විහාරගම් පිළිබඳ පනත
(5) 1935 ඉඩම් පනත (......)

(10) (1) සම්බනාර් කෝවිල (2) මුන්නේශ්වරම් කෝවිල (3) බැරැන්ඩි කෝවිල
(4) කන්දසාමි කෝවිල (5) තිරුක්කෝවිල් (......)

- **අංක 11 සිට 15 තෙක් වූ ප්‍රශ්න සඳහා පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලය පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

| | | | | |
|---|---|---|---|---|
| (11) | (1) | කොල්බෲක් කොමිසම | රාජකාරිය අවලංගු කිරීම | |
| | (2) | මෝර්ගන් කොමිසම | ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුව පිහිටු වීම | |
| | (3) | ඕ. මියුරන් කොමිසම | සිවිල් සේවාව ආරම්භ කිරීම | |
| | (4) | ඩොනමෝර් කොමිසම | සර්වජන ඡන්ද ක්‍රමය | |
| | (5) | සොල්බරි කොමිසම | කැබිනට් ක්‍රමය | (......) |
| (12) | (1) | උපතිස්සග්‍රාම | කදම්බ නදී | |
| | (2) | උරුවෙලග්‍රාම | ගෝණ නදී | |
| | (3) | කාචරග්‍රාම | කප්පකන්දර නදී | |
| | (4) | විජිතග්‍රාම | මහාවාලුකා නදී | |
| | (5) | දීඝග්‍රාම | කළ්‍යාණ නදී | (......) |
| (13) | (1) | ලොරෙන්සෝ ද අල්මේදා | පෘතුගීසි | |
| | (2) | ස්පිල්බර්ජන් | ස්පාඤ්ඤ | |
| | (3) | ද ලැනරෝල් | ප්‍රංශ | |
| | (4) | සී බෝල්ට් ද වාර්ට් | ලන්දේසි | |
| | (5) | ජෝන් පයිබස් | ඉංග්‍රීසි | (......) |
| (14) | (1) | රොබට් නොක්ස් | එදා හෙළදිව | |
| | (2) | පුවාන් රිබෙයිරෝ | ලංකාවේ පනස් වසරක් | |
| | (3) | පර්නාවෝ ද ක්වීරෝස් | ලංකාවේ දේශපාලන හා ආධ්‍යාත්මික ආධිපත්‍යය | |
| | (4) | එමර්සන් ටෙනන්ට් | ලංකාව | |
| | (5) | එච්.සී.පී. බෙල් | කෑගල්ල වාර්තාව | (......) |
| (15) | (1) | බෝවත්තේ ගල සෙල්ලිපිය | ප්‍රාදේශීය රජ පෙළපතක් පිළිබඳ තොරතුරු | |
| | (2) | කුච්චවේලි සෙල්ලිපිය | මහායාන අදහස් සඳහන් වේ | |
| | (3) | ගොඩවාය සෙල්ලිපිය | වරාය බදු | |
| | (4) | තිරියාය සෙල්ලිපිය | ග්‍රාම පාලනය ගැන | |
| | (5) | හෝපිටිගම සෙල්ලිපිය | වෙළඳපල පරිපාලනය පිළිබඳ නීති | (......) |

- **අංක 16 සිට 25 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් x සහ y තීරුවල දී ඇත. y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු x තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. x තීරුව y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි සංයෝගයට අයත් අංකය, තෝරා තිත් ඉර මත ලියන්න.**

| | | **x** | | **y** |
|---|---|---|---|---|
| (16) | (i) | කොටවෙහෙර | A | ත්‍රිකුණාමලය |
| | (ii) | ථූපාරාම දාගැබ | B | මල්වතු ඔය |
| | (iii) | කණ්ඨක චේතිය | C | දැදුරු ඔය |
| | (iv) | තිවංක පිළිමගෙය | D | මැණික් ඔය |
| | (v) | තිරුකෝණේශ්වරම් කෝවිල | E | කලා ඔය |

(1) BEDCA (2) BDECA (3) BDCEA (4) BAEDC (5) BADEC (......)

The National e-learning Portal for The General Education

(17)

| | | | |
|---|---|---|---|
| (i) | පළමුවන රාජරාජ | A | පාණ්ඩ්‍ය |
| (ii) | මාඝ | B | කාලිංග |
| (iii) | චන්ද්‍රභානු | C | චීන |
| (iv) | ජටාවර්මන් | D | ජාවක |
| (v) | චෙං හෝ | E | චෝළ |

(1) ACBED (2) BAECD (3) CADBE (4) DCBEA (5) EBDAC (......)

(18)

| | | | |
|---|---|---|---|
| (i) | 1215 | A | ලන්දේසීන් පලවා හැරීම. |
| (ii) | 1521 | B | පෘතුගීසීන් පලවා හැරීම. |
| (iii) | 1658 | C | මාඝගේ ආක්‍රමණය |
| (iv) | 1796 | D | උඩරටියන්ගේ බ්‍රිතාන්‍ය විරෝධී සටන |
| (v) | 1817 18 | E | විජයබා කොල්ලය |

(1) BAECD (2) CEBAD (3) DECAB (4) BCEAD (5) BAEDC (......)

(19)

| | | | |
|---|---|---|---|
| (i) | සමන්තපාසාදිකා | A | දඹදෙණි යුගය |
| (ii) | සසඳාවත | B | පොළොන්නරු යුගය |
| (iii) | සිදත් සඟරාව | C | මහනුවර යුගය |
| (iv) | මයුර සංදේශය | D | අනුරාධපුර යුගය |
| (v) | මන්දාරම්පුර පුවත | E | ගම්පොළ යුගය |

(1) DABCE (2) DBAEC (3) BAEDC (4) DBCEA (5) ECABD (......)

(20)

| | | | |
|---|---|---|---|
| (i) | සපුමල් කුමාරයා | A | ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා |
| (ii) | ටිකිරි බංඩාර | B | දෙවන රාජසිංහ රජතුමා |
| (iii) | මහා අස්ථාන | C | හයවන බුවනෙකබාහු රජතුමා |
| (iv) | කොනප්පු බංඩාර | D | පළමුවන රාජසිංහ රජතුමා |
| (v) | කන්නසාමී | E | පළමුවන විමලධර්මසූරිය රජතුමා |

(1) CDABE (2) ECABD (3) CDBEA (4) DBCEA (5) BAEDC (......)

(21)

| | | | |
|---|---|---|---|
| (i) | වසභ | A | හුරුළු වැව |
| (ii) | මහාසේන | B | මහවිලච්චිය වැව |
| (iii) | පළමුවන උපතිස්ස | C | නාච්චදූව වැව |
| (iv) | මොග්ගල්ලාන | D | කන්තලේ වැව |
| (v) | දෙවන අග්ගබෝධි | E | තෝපා වැව |

(1) ACBED (2) BAECD (3) CADBE (4) DCBEA (5) EBDAC (......)

(22)

| | | | |
|---|---|---|---|
| (i) | කුරුවේ බද්ද | A | ප්‍රවාහන දෙපාර්තමේන්තුව |
| (ii) | මඩිගේ බද්ද | B | අලි ඇතුන් පිළිබඳ දෙපාර්තමේන්තුව |
| (iii) | මහ බද්ද | C | වියන්නන් පිළිබඳ කාර්යාංශය |
| (iv) | කොට්ටල් බද්ද | D | කුරුඳු දෙපාර්තමේන්තුව |
| (v) | කින්නර බද්ද | E | ශිල්පීන් පිළිබඳ දෙපාර්තමේන්තුව |

(1) BEDCA (2) BDECA (3) BDCEA (4) BAEDC (5) BADEC (......)

The National e-learning Portal for The General Education

(23) (i) 1802 — A සමූපකාර දෙපාර්තමේන්තුව පිහිටුවීම.

(ii) 1862 — B මිනින්දෝරු දෙපාර්තමේන්තුව පිහිටුවීම.

(iii) 1900 — C වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම.

(iv) 1912 — D ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව පිහිටුවීම.

(v) 1930 — E කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීම.

(1) BEDCA (2) BDECA (3) BDCEA (4) BAEDC (5) BADEC (......)

(24) (i) කොළඹ නුවර මහා මාර්ගය ඉදිකිරීම. — A වෙස්ට් රිජ්වේ

(ii) ද්‍රවිඩ මහජන සභාව පිහිටුවීම — B ජෝර්ජ් බර්ඩ්

(iii) ප්‍රථම කෝපි වත්ත ආරම්භ කිරීම — C එඩ්වර්ඩ් බාන්ස්

(iv) ශ්‍රී ලංකා වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම — D පොන්නම්බලම් රාමනාදන්

(v) ව්‍යවස්ථාදායක සභාවට පත් වූ ප්‍රථම උගත් ලාංකිකයා — E පොන්නම්බලම් අරුණාචලම්

(1) BCEDA (2) ACBED (3) DCBAE (4) EBCAD (5) CEBAD (......)

(25) (i) වල්ලිපුරම් — A කතිකාවත

(ii) ගල්පොත — B පර්වත ලිපිය

(iii) ගල්විහාර — C රන් සන්නස

(iv) තෝණිගල — D තඹ සන්නස

(v) පනාකඩුව — E පුවරු ලිපිය

(1) CEBDA (2) ACDBE (3) CEADB (4) BACED (5) CEBAD (......)

- **අංක 26 - 30 තෙක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර 4 ක් ඇති අතර ඉන් එක් ප්‍රතිචාරයක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. පහත උපදෙස් අනුව නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

A හා B පමණක් නිවැරදි නම් .................... 1 ද,
B හා C පමණක් නිවැරදි නම් .................... 2 ද,
C හා D පමණක් නිවැරදි නම් .................... 3 ද,
A හා C පමණක් නිවැරදි නම් .................... 4 ද,
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් 5 ද තිත් ඉර මත ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (B) සහ (c) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

(26) ඩොනමෝර් කොමිසමේ ප්‍රධාන නිර්දේශ කවරේ ද?

(A) නිදහස් අධ්‍යාපනය හඳුන්වා දීම.

(B) විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දීම.

(C) වාර්ගික නියෝජන ක්‍රමය තවදුරටත් පවත්වා ගෙනයාම.

(D) රාජ්‍ය සේවා කොමිසන් සභාව පිහිටුවීම. (......)

(27) අනුරාධපුරයේ සිට පොළොන්නරුවට අග නගරය මාරු කිරීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) කලබලකාරී රෝහණ ප්‍රදේශය පාලනය කිරීම සඳහා.

(B) අනුරාධපුරයට වඩා පොළොන්නරුව මධ්‍යගතව පිහිටීම.

(C) මායා රටින් ආක්‍රමණ එල්ලවීම.

(D) මෝරිය හා ලම්බකර්ණ පෙළපත් අතර ගැටුම්. (......)

(28) සීතාවක රාජධානිය හා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

(A) සීතාවක රාජධානිය පිහිටුවන ලද්දේ පෘතුගීසීන් විසිනි.

(B) සීතාවක රාජසිංහ රජු විසින් කොළඹ කොටුව අල්ලා ගන්නා ලදී.

(C) එහි ප්‍රථම පාලකයා වූයේ මායාදුන්නේ රජුය.

(D) සීතාවක රජවරු මුස්ලිම් වෙළෙඳුන්ගෙන් ආරක්ෂා කළහ. (......)

(29) පෘතුගීසි පාලනයේ ප්‍රතිඵල සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

(A) තොම්බු සම්පාදනය කිරීම.

(B) රෝම ලන්දේසි නීතිය හඳුන්වා දීම.

(C) රෝමානු කතෝලික ආගම හඳුන්වා දීම.

(D) වතු ආර්ථිකය තහවුරු වීම. (......)

(30) වට්ටගාමිණී අභය රජුට මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර සාධකය / සාධක නිවැරදි වේද?

(A) කාලිංස මාඝ ආක්‍රමණය (B) තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ල

(C) මහා සාගතය (D) චන්ද්‍රභානුගේ ආක්‍රමණය (......)

- **අංක 31 සිට 35 තෙක් වූ සෑම ප්‍රශ්නයක ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එම නොගැළපෙන කරුණ තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**

(31) කෝපි වගාවේ ව්‍යාප්තිය,

(1) කෝපි වගාවේ හිමිකාරිත්වය බහුල වශයෙන් ම යුරෝපීයයන් සතු විය.

(2) කෝපි වගාව සඳහා අවශ්‍ය වූ ශ්‍රමිකයින් දකුණු ඉන්දියාවෙන් ගෙන්වා ගන්නා ලදී.

(3) කෝපි වගාව වැඩි වශයෙන්ම පැවතියේ උතුරු පළාතේ ය.

(4) හැමීලියා වැස්ටාට්‍රික්ස් නමැති කෝපි කොළ වසංගත රෝගය නිසා කෝපි වගාව විනාශ විය.

(5) කෝපි වගාවේ ව්‍යාප්තිය නිසා ඉඩම් විකිණීම වර්ධනය විය. (......)

(32) රජරට ශිෂ්ටාචාරයේ පිරිහීම සහ බිඳ වැටීම,

(1) චන්ද්‍රභාණු ආක්‍රමණය (2) වාරිමාර්ග පද්ධතියේ බිඳ වැටීම

(3) කාලිංග සහ පාණ්ඩ්‍ය පෙළපත් අතර වූ ගැටුම් (4) දුර්වල පාලකයන්

(5) මාඝ ආක්‍රමණය (......)

(33) යාපනය රාජධානිය,

(1) යාපනයේ පැරණි ඉතිහාසය හැදෑරීමට ප්‍රධාන මූලාශ්‍රය යාල්පාන වෛප මාලෙ නමැති ග්‍රන්ථයයි.

(2) රාජධානියේ අගනගරය වූයේ නල්ලූර්ය.

(3) ආර්ය චක්‍රවර්තී රජවරු ඉතා බලවත් වූහ.

(4) ආර්ය චක්‍රවර්තී රජවරු ගම්පොළ රාජධානිය ආක්‍රමණය කළහ.

(34) විජයබා කොල්ලය,
- (1) කෝට්ටේ රාජධානිය කොටස් තුනකට බෙදී යෑම.
- (2) කෝට්ටේ රාජ්‍යය තුළ මුස්ලිම් වෙළඳුන්ගේ බලය වර්ධනය වී යෑම.
- (3) සීතාවක රාජ්‍යය බිහිවීම.
- (4) කෝට්ටේ රජවරුන්ගේ බලය දුර්වල වී යෑම.
- (5) මුහු බඩ ප්‍රදේශවල පෘතුගීසි බලය වර්ධනය වී යෑම. (......)

(35) කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය,
- (1) විධායක සහ ව්‍යවස්ථාදායක සභා පිහිටුවීම.
- (2) නව අධිකරණ ක්‍රමයක් මුළු දිවයින තුළ ම ඇති කිරීම.
- (3) සීමිත ඡන්දයෙන් නියෝජිතයින් තෝරාගැනීම.
- (4) සිවිල් සේවකයන්ගේ සංඛ්‍යාව අඩු කිරීම.
- (5) මුළු දිවයිනටම ඒකාබද්ධ පාලනයක් ඇතිකිරීම. (......)

- **අංක 36 සිට 40 දක්වා වූ සෑම ප්‍රශ්නයකටම ප්‍රකාශ දෙක බැගින් ඇතුළත් වේ. එම ප්‍රකාශ යුගලයන්ට හොඳින්ම ගැළපෙන්නේ පහත දී ඇති විග්‍රහයන්ගෙන් කුමන විග්‍රහය දැයි තෝරා ඊට අදාළ අංකය ප්‍රකාශ ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | වැරදිය. | නිවැරදිය. |
| (2) | නිවැරදිය. | වැරදිය. |
| (3) | නිවැරදිය. | නිවැරදිය. |
| (4) | වැරදිය. | වැරදිය. |
| (5) | නිවැරදිය. | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|
| (36) වෙළඳාම සඳහා විටින් විට ශ්‍රී ලංකාවට පැමිණි විවිධ රටවල ජනයා මෙහි ජනාවාස ඉදි කිරීමට පුරෝගාමී වූ බවට සාධක ඇත. | ආර්යයන් සිය ජනාවාස පිහිටුවා ගැනීමේදී ලංකාවේ වියළි කලාපයේ ගංගා ඇසුරු කරගෙන තිබේ. | (......) |
| (37) මහසෙන් රාජ්‍ය සමය අභයගිරියේ ප්‍රගතියට හේතුවිය. | සංඝමිත්‍ර භික්ෂුව විසින් මහසෙන් රජු පොළොඹවන ලදුව මහා විහාරය විනාශයට පත් කෙරිණි. | (......) |
| (38) දීපවංශය ලංකාවේ ඓතිහාසික මූලාශ්‍ර අතර දැනට ඇති පැරණිම කෘතියකි. | වංසත්ථප්පකාසිනිය ලෙස හඳුන්වන්නේ දීප වංශයට ලියන ලද අටුවා ග්‍රන්ථයයි. | (......) |
| (39) සේනාපති තනතුර පැරණි ලංකා රාජ සභාවේ වැදගත් තිලයක් වේ. | සේනාපතිකම ලැබුණේ රජුගේ ඉතා විශ්වාසවන්ත ඥාතිවරයෙකුට පමණි. | (......) |
| (40) ලංකාවේ කෝපි වගාවේ ස්වර්ණමය යුගය වූයේ 1875 1900 අතර කාලයේ ය. | කෝපි වගාව පරිහානියට පත්වූයේ තේ වගාවේ ඇතිවූ දියුණුව නිසාය. | (......) |

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ශ්‍රී ලංකා ඉතිහාසය - II

**13 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- **පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න 03 කටත් පිළිතුරු සපයන්න.**
  **(ප්‍රශ්න අංක 01 ට පිළිතුරු සැපයීම සඳහා සිතියමක් සපයා ඇත.)**

---

(01) ඔබට සපයා ඇති ආකෘති ශ්‍රී ලංකා සිතියමේ පහත සඳහන් **සියලු ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් ඕනෑම දෙකක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(1) දීඝවාපිය
(2) මහාතිත්ථ
(3) නාච්චදූව වැව
(4) දැදුරු ඔය
(5) දොළොස් දහස් රට
(6) බලන
(7) කල්‍යාණි
(8) නල්ලූර්

(ඉහත සඳහන් ඕනෑම ස්ථාන දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න. සිතියම් ලකුණු කිරීමට ලකුණු 01 × 08 / කෙටි සටහන් සඳහා ලකුණු 05 × 02 = ලකුණු 18)

(02) ආර්ය ජනාවාස ආරම්භ වීම හා ව්‍යාප්ත වීම පිළිබඳ විමසන්න. (ලකුණු 14)

(03) මහසෙන් රාජ්‍ය සමයේ අවසානය දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේ දී ඓතිහාසික මූලාශ්‍රයක් වශයෙන් මහාවංශයේ දක්නට ලැබෙන ප්‍රබලතා සහ දුබලතා සාකච්ඡා කරන්න. (ලකුණු 14)

(04) ධාතුසේන රජුගේ පාලන සමයේ වාරිමාර්ග ක්‍රමයේ වර්ධනය පිළිබඳ විමසන්න. (ලකුණු 14)

(05) ලංකාවේ චෝළ පාලනය පිළිබඳ විමසන්න. (ලකුණු 14)

(06) කෝට්ටේ යුගයේ දී පෘතුගීසීන්ගේ මිෂනාරි කටයුතු පිළිබඳ විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 14)

(07) 1818 විමුක්ති අරගලයට හේතු සහ එහි ප්‍රතිඵල සාකච්ඡා කරන්න. (ලකුණු 14)

(08) ලංකාවේ ලන්දේසින්ගේ ආර්ථික ප්‍රතිපත්තිය විග්‍රහ කරන්න. (ලකුණු 14)

II කොටසේ 01 ප්‍රශ්නය සඳහා ශ්‍රී ලංකා ආකෘති සිතියම

## ශ්‍රී ලංකා සිතියම

